# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,325 — 1965 පෙබරවාරි 19 වැනි සිකුරාදා — 1965.2.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# III වැනි කොටස—ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1965 අංක 71 දරණ ආඥාව

ජේ. 63/64 ඊ 412

යොමු අංකය :——————

කිව්. සී. 283

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වේලාතන්ත්‍රි ගුරුන්නාන්සේලාගේ කරුණාරත්න වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

වී. ටී. ජී. කරුණාරත්න,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1965 පෙබරවාරි මස 10 දා.

## උපලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | II<br>ඉඩමේ විස්තරය |
| --- | --- |
| කොළඹ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරී. | කොළඹ දිස්ත්‍රික්කයේ බස්නාහිර සියනෑ කෝරළේ (අදිකාරි පත්තුවේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ කැලණිය කොහල්විල ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 2 ක් පමණ වූ ගොරකගහවත්ත නමැති ඉඩමට මායිම් :—<br>උතුරට : හෙට්ටිආරච්චිගේ දෝන සෙලෙස්තිනා අයිතිකම් කියන මිල්ලගහවත්ත ; නැගෙනහිරට : ගම්මානයට යාමට වැටී ඇති ප්‍රසිද්ධ පාරේ සිට ඇති අඩි 8 ක් පමණ පළල පොදු පාර ; දකුණට : පන්සල් පාර ; බස්නාහිරට : කොහල්විල මිශ්‍ර පාසැල පිහිටි ඉඩම. |

2-778


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

121—අාර් 4805—1,575 (65/2)